*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

# කතෝලික ධර්මය

**09 ශ්‍රේණිය** **කාලය පැය 02 යි**

නම/ විභාග අංකයඃ

## I කොටස

- අංක 01 - 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පුරාණ ගිවිසුමේ දැක්වෙන පරිදි අනුකම්පාවේ, කරුණාවේ හා ප්‍රේමයේ සංකේතයකි

(1) චර්මච්ඡේදනය (2) වලාකුළු (3) දේදුන්න (4) නොදැවෙන පඳුර

02. වීර නායකයින් පත්කිරීම පිළිබඳව සඳහන් වන්නේ,

(1) වීරාවලියේ ය. (2) වංශාවලියේ ය. (3) ගිතාවලියේ ය. (4) දිවෙසාවලියේ ය.

03. ඊශ්‍රායල් දේශය එක්සත්කොට ප්‍රබල රාජ්‍යයක් ගොඩනැගීමේලා පුරෝගාමී වූ පළමු රජතුමා වන්නේ,

(1) සාමුවෙල් ය. (2) සාවුල් ය. (3) දාවිත් ය. (4) සලමොන් ය.

04. උපක්‍රමශීලීව දාවිත් රජතුමා කළ වරද පෙන්වාදෙමින් ඔහු යහමඟට ගනුලැබූ දිවැසිවරයා වන්නේ,

(1) ආමෝස් ය. (2) යෙසායා ය. (3) මීකා ය. (4) නාතාන් ය.

05. ''මම සමිඳාණන් වහන්සේට විරුද්ධව පව් කළෙමි.'' මෙසේ ප්‍රකාශ කරනු ලබන්නේ,

(1) සාමුවෙල් ය. (2) එසකියෙල් ය. (3) දාවිත් ය. (4) සලමොන් ය.

06. සලමොන් රජතුමා විසින් ජෙරුසලම් දේව මන්දිරය ගොඩනැගූ බව සඳහන් වන ග්‍රන්ථය වන්නේ,

(1) 1 සාමුවෙල් ය. (2) 2 සාමුවෙල් ය. (3) 1 රාජාවලිය යි. (4) 2 රාජාවලිය යි.

07. ජන්ම දිනයේදීම ආදි මව්පියන්ගෙන් අප ලබන පාප දෝෂය ජන්ම පාපය බව සඳහන් වන ග්‍රන්ථය වන්නේ,

(1) මහෝපදේශය ය. (2) හිතෝපදේශය ය. (3) ගිතාවලිය ය. (4) රාජාවලිය ය.

08. ''ඔබ අතුරෙන් යමෙක් රෝගීව සිටින්නේ නම් ඔහු සභා මූලිකයන් කැඳවා ගනීවා.'' මෙසේ ප්‍රකාශ කරන්නේ,

(1) පේදුරුතුමා ය. (2) ජාකොබ්තුමා ය. (3) තෝමස්තුමා ය. (4) ජුවාම්තුමා ය.

09. ආරම්භක දේව ප්‍රසාද නිධාන ඇතුලත් වරණය වන්නේ,

(1) ප්‍රසාද ස්නාපනය, අභිවෘද්ධි ආලේපය, රෝගින්ගේ ආලේපය

(2) ප්‍රසාද ස්නාපනය, දිව්‍ය සත්ප්‍රසාදය, පාප උච්චාරණය

(3) ප්‍රසාද ස්නාපනය, පාප උච්චාරණය, රෝගීන්ගේ ආලේපය

(4) ප්‍රසාද ස්නාපනය, දිව්‍ය සත්ප්‍රසාදය, අභිවෘද්ධි ආලේපය

10. මිනිස් ජීවිතයේ ස්වාමියාණෝ දෙවියන් වහන්සේ පමණක් වන සේක. මෙම ප්‍රකාශය උපුටා ගනු ලැබුවේ.

(1) කතෝලික සභා ධර්මෝපදේශයෙනි. (2) ශුද්ධවූ සභාව පිළිබඳ ප්‍රකාශනයෙනි.

(3) විශ්ව සභා ඉතිහාසයෙනි. (4) ශුද්ධ ලියවිල්ලෙනි. (ල. 2 x10 = 20)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

(ශුද්ධාත්මයාණන්ගේ / සලමොන් / සාමුවෙල් / ඇඳහිල්ලේ / දුගීන්ට හිංසා කිරීම)

11 ඊශ්‍රායෙල් රාජ්‍යයේ අවසාන විනිශ්චයකරුවා ........................................ ය.

12 ස්වාමින් වහන්සේට ඉතා අලංකාර දේව මාලිගයක් ඉදිකරනු ලැබුවේ ........................................ රජතුමා විසිනි.

13 ........................................ ස්වර්ගයට මොර ගසන පව්වලින් එකකි.

14 ඔබේ ........................................ ස්ථිරව සිට යක්ෂයාට විරුද්ධ වන්න.

15 අප ශුද්ධවන්තව ජීවිතය ගතකළ යුතු වන්නේ ........................................ මන්දිරයක් වන බැවිනි. (ල. 2 x5 = 10)

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට ''A'' කොටසේ සඳහන් ප්‍රකාශනවලට ගැලපෙන පිළිතුරට අදාළ අංකය ''B'' කොටසින් තෝරා ඉදිරියෙහි ඇති වරහන තුළ ලියන්න.**

| | A | | B |
|---|---|---|---|
| 16 | දාවිත් රජු විසින් පරාජය කරන ලදී | ( ) | 1. මොනිකාතුමිය |
| 17 | සිය දිවි හානි කර ගැනිම | ( ) | 2. පාපෝච්චාරණය |
| 18 | ''ඔබ ලැබූ ප්‍රසාද ස්නාපනය මේ ජලය මගින් ඔබට සිහි ගැන්වේවා'' | ( ) | 3. මරණීය පාපයකි |
| 19 | සදාකාලික දඬුවමින් මිදීමට ඇති මාර්ගයකි | ( ) | 4. රෝගීන් ආලේප කිරීම |
| 20 | ආදර පුතුනි මගේ දිවියෙහි තිබුණ එකම පැතුම ඔබ කිතුනුවකු වනු දැකීමයි | ( ) | 5. ගොලියත් යෝධයා |

(ල. 2 x5 = 10)

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

01. (i) පැරණි ගිවිසුමේ වීරාවලියේ ඇතුළත් වීරවරු දෙදෙනෙක් නම් කරන්න.
(ii) ඊශ්‍රායෙල් සෙනග විනිශ්චය පිණිස සාමුවෙල් වසරක් පාසා ගමන් කළ ස්ථාන දෙකක් ලියන්න.
(iii) කර්ම පාපය බෙදෙන කොටස් දෙක නම් කරන්න.
(iv) මුල් අගුණ පව් දෙකක් ලියන්න.
(v) ශුද්ධාත්මයාණන්ට විරුද්ධ පාප දෙකක් ලියන්න.
(vi) සිත් හැරීමෙන් පව් කමාව ලබාගතයුතු බව පෙන්වාදෙන උපමා දෙකක් නම් කරන්න.
(vii) මෝසෙස්ගේ නීතිය අනුව කාමමිථ්‍යාචාරය කළ අයට හිමි දඬුවම කුමක් ද?
(viii) ශුද්ධවූ අගුස්තීනු මුනිතුමාගේ ජීවිත වෙනසට බලපෑ ප්‍රධාන කරුණු දෙක ලියන්න.
(ix) පාපයට ලැබෙන දඬුවම් දෙවර්ගය නම් කරන්න.
(x) ජාකොබ්තුමාගේ ලිපියෙහි සඳහන් පරිදි රෝගියෙකු සඳහා කළයුතු කාර්යයන් දෙකක් ලියන්න.
(ල. 2 x10 = 20)

02. (i) වීර නායකයන් සතු කාර්යයන් දෙකක් ලියන්න.
(ii) වීර නායකයන් ජනතාව වෙත ගෙනගිය පණිවිඩ තුනක් ලියන්න.
(iii) නායකත්වයේ වගකීම නිසිලෙස ඉටුකිරීමේ දී ඔබට වීර නායකයන්ගෙන් ලබාගතහැකි ආදර්ශ පහක් ලියන්න. (ල. 2 + 3 + 5 = 10)

03. (i) කර්ම පාපය හඳුන්වන්නේ කෙසේද?
(ii) බරපතල හෙවත් මරණීය පාපයෙන් ලබන විපාක තුනක් ලියන්න.
(iii) මුල් අගුණ පාපවලින් වැළකී දැහැමි ජීවිතයක් ගෙවීමට ඔබට කළහැකි දේවල් පහක් ලියන්න.
(ල. 2 + 3 + 5 = 10)

04. (i) පාප පරීක්ෂාවට හසුවී සමගි සන්ධානයේ ප්‍රසාද නිධානය ලබානොගැනීමේ විපාක දෙකක් ලියන්න.
(ii) පාපයට වන්දියක් ලෙස කළහැකි ක්‍රියාකාරකම් තුනක් ලියන්න.
(iii) සමගි සන්ධානයේ ප්‍රසාද නිධානය මගින් පාපයට සමාව ලබාගැනීමට අනුගමනය කළයුතු පියවර පහක් ලියන්න. (ල. 2 + 3 + 5 = 10)

05. (i) රෝගීන් ආලේප කිරීමේ ප්‍රසාද නිධානයේ දී අනුගමනය කරන පළමු පිළිවෙත් දෙක ලියන්න
(ii) රෝගීන් ආලේපය දේව ප්‍රසාද නිධානය ලැබිය හැකි අය කාණ්ඩ තුනක් ලියන්න.
(iii) රෝගී පුද්ගලයකුට සමිඳු තුළ සුවය අත්දකින්නට ඔබට කළහැකි ක්‍රියාකාරකම් පහක් ලියන්න.
(ල. 2 + 3 + 5 = 10)

06. (i) මව්කුසේ සිටින ජීවිතය පවා දෙවියන් වහන්සේට අයිති බව සඳහන් කරන ග්‍රන්ථ දෙක නම් කරන්න.
(ii) මිනිසා තම ජීවිතයට විරුද්ධව කරන වැරදි ක්‍රියාවන් තුනක් ලියන්න.
(iii) දේව දරුවන් ලෙස අපගේ පැවැත්ම ශ්‍රේෂ්ඨ විය යුතුය යන ප්‍රකාශය සමාජය තුළ ජීවත් කරවීමට ඔබට කළහැකි කාර්යයන් පහක් ලියන්න. (ල. 2 + 3 + 5 = 10)

07. (i) පෙම් කරන්න එකිනෙකාට ....................................................
.................................................... සමිඳුන් තුළ ප්‍රීතියෙන් මෙම ගීතිකාව සම්පූර්ණ කරන්න.
(ii) අන් අයගේ ජීවිත සුරැකීමට ඔබට කළහැකි දේවල් තුනක් ලියන්න.
(iii) කිතුනුවන් තමාට මෙන්ම අන්‍යයන්ට ද ප්‍රේම කළ යුතු බැවින් මිනිස් ජීවිතයේ වටිනාකම අද සමාජයට පෙන්වා දිය හැකි ආකාර පහක් ලියා දක්වන්න. (ල. 2 + 3 + 5 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. (3) 02. (1) 03. (2) 04. (4) 05. (3) 06. (3) 07. (1) 08. (2) 09. (4) 10. (1)

11. සාමුවෙල් 12. සලමොන් 13. දුගීන්ට හිංසා කිරීම 14. ඇඳහිල්ල 15. ශුද්ධාත්මයාණන්

16. (5) 17. (3) 18. (4) 19. (2) 10. (1) (ලකුණු 20 යි.)

## II කොටස

01. (i) දෙබෝරා / ගිඩියොන් / තෝලා / සැම්සොන් පෙළ පොත (37 පිටුව)

(ii) බෙතෙල් / ගල්ගාල් / මිෂ්පා (39 පිටුව)

(iii) සුළු පාපය හා බරපතල පාපය (මරණීය) (48 පිටුව)

(iv) උඩඟුව / තන්හාව / රාගය / ක්‍රෝධය / කෑදරය (49 පිටුව)

(v) තම ගැලවීම ගැන බලාපොරොත්තු කඩකර ගැනීම / ආගමික සත්‍යතා ප්‍රතික්ෂේප කිරීම / පාපයෙහි ඇලී ගැලී සිටීම (50 පිටුව)

(vi) නැතිවූ පුත්‍රයා පිළිබඳ උපමාව / නැතිවූ කාසිය පිළිබඳ උපමාව (52, 53 පිටු)

(vii) ගල්ගසා මරන්නට නියම විය

(viii) මවගේ බලවත් යාච්ඤාව / අම්බ්‍රෝස්තුමාගේ මඟපෙන්වීම (54 පිටුව)

(ix) සදාකාලික දඬුවම හා කාලීන දඬුවම් (57 පිටුව)

(x) සභා මූලිකයෝ කැඳවා ගැනීම / රෝගියාව ස්වාමින් වහන්සේගේ නාමයෙන් තෙලෙන් ආලේප කිරීම / ඔහු උදෙසා යාච්ඤා කිරීම (61 පිටුව) (ල. 2x10=20)

02. (i) ඊශ්‍රායල්වරුන්ට එල්ලවූ යුද්ධවලදී නායකත්වය දීම / ජුදා ජනතාව එක්සත් කිරීම / ජාතියක් ලෙස ගොඩ නැගීම (36 පිටුව)

(ii) දෙවියන් වහන්සේ තම ජනතාව ආරක්ෂා කරන බව / ජයග්‍රහණ අත්කර දෙන්නේ දෙවියන් වහන්සේ බව / ජුදා ජනතාවගේ පාපයට දඬුවම පීඩා විඳීම බව (37 පිටුව)

(iii) අන් අයගේ යහපත වෙනුවෙන් ක්‍රියා කිරීම / අන් අය මුහුණ දෙන ගැටළුවලදී උදව් කිරීම / දෙවියන් වහන්සේ මත යැපීම / ජනතාව සමග සමගියෙන්, එකමුතුකමින් ජීවත්වීම වැනි කරුණු (පිටු අංක 40 උදව් කර ගන්න.)

03. (i) හොඳ නරක දැනගත් කෙනෙකු විසින් සිතින්, වචනයෙන්, ක්‍රියාවෙන් හෝ අතපසු කිරීමෙන් හෝ දේව පනත් කඩකිරීම (48 පිටුව)

(ii) දෙවියන් වහන්සේ සමග මිත්‍රත්වය කැඩීයයි. / අපගේ ආත්මික ජීවිතය මරණයට පත්වේ / ඉෂ්ට වරප්‍රසාද අහිමිවී නිරය හිමිවේ (48 පිටුව)

(iii) තමාගේ හැකියා පාරට්ටු කරනොගෙන නිහතමානී වීම / පරිත්‍යාගශීලී වීම / රාගික හැඟීම්වලින් මිදීම / සැමට යහපත පැතීම / කෑදරවීමෙන් ඉවත්වීම / අන් අයගේ ජයග්‍රහණවලදී සතුටුවීම (49 පිටුව)

04. (i) ඉෂ්ට වරප්‍රසාද අහිමිවීම / ස්වර්ග රාජ්‍යයට ඇතුළුවීමේ වරම අහිමිවේ (57 පිටුව)

(ii) යාච්ඤාව / විවිධාකාර පශ්චත්තාපික ක්‍රියා / ශාරීරික පුණ්‍ය ක්‍රියා / දයාවේ ක්‍රියා (58 පිටුව)

(iii) හොඳ පාපොච්චාරණයක් කිරීමට පිහිට පතා යාච්ඤා කිරීම (දේව පනත් ශුද්ධවූ සභාවේ පනත් කඩවීම පිළිබඳ ආත්ම සෝදිසියක යෙදීම) / දේව ආදරයට පිටුපෑම පිළිබඳව අවංකව කණගාටුවී කළ වැරදි ප්‍රතික්ෂේප කිරීම / යළි එම පව් නොකිරීමට ඉටා ගැනීම / කළ පව් නොසඟවා පියතුමාට පැවසීම / පියතුමා දෙන දඬුවම් ඉටුකිරීම (59 පිටුව)

**පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස**

05. (i) ආරම්භක පිළිවෙත / පශ්චත්තාපිත පිළිවෙත

(ii) වයස්ගතවී හෝ රෝගීවී හෝ මරණාසන්නයේ සිටින අය / බරපතල සැත්කම්වලට සූදානම් කරන අය / මරණාසන්න නොවූවත් ස්වල්ප කාලයකින් මියයාහැකි අය (62 පිටුව)

(iii) පෞද්ගලිකව තමාගෙත් මුළු ශුද්ධවූ සභාවේත් යහපත වෙනුවෙන් රෝගීවූ පුද්ගලයා ක්‍රිස්තුන් වහන්සේගේ දුක් ප්‍රාප්තියට සම්බන්ධ කිරීම / රෝගී වීමෙන් හෝ වයස්ගතවීමෙන් ඇතිවන වේදනා දරාගැනීමට ශක්තිය, ධෛර්යය ලැබීම / පව්කමා කිරීමේ ප්‍රසාද නිධානය ලබාගැනීමට අවස්ථාවක් නොතිබුණේනම් ඔහුගේ, ඇයගේ පාපවලට සමාව ලැබීම (පිටුව 63)

(iii)

06. (i) ජෙරමියා හා ගිතාවලිය

(ii) මත්පැන් මත්ද්‍රව්‍ය භාවිතය / අසනීප වූ විට බෙහෙත් නොගැනිම / අක්‍රමවත් ආහාර රටාව / ශරීරයට අවශ්‍ය ව්‍යායාම නොලැබීම (පිටුව 72, 73)

(iii) පිටුව 79 උදව් කරගනිමින් ලියා ඇති පිළිතුර සලකා ලකුණු දෙන්න.

07. (i) සුහද සොයුරු ප්‍රේමයෙන් / දිවි ගෙවන්න එකමුතුවී (පිටුව 75)

(ii) ඊර්ෂ්‍යාව, පළිගැනීම වැනි පාපයන් අත්හැරීම / සැමට ප්‍රේම කිරීම / වරදට සමාව දීම (පිටු 75 - 76)

(iii) මිනිස් ජීවිතය දේව තිළිණයක් බව / මිල කළ නොහැකි බව / දේව සමානකම හා ස්වරූපය නිසා උතුම් බව / තමාගේ මෙන්ම අන්‍යයන්ගේ ජීවිත ආරක්ෂා කිරීම දේව කැමැත්ත බව / නූපන් දරුවන් සතු ජීවත්වීමේ අයිතිය යනාදී කරුණුද සමග සිසුවා ලියා ඇති කරුණුවලට ලකුණු දෙන්න.